**මාතලේ ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාතලේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මාතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මෘත දේහ ආදාහනය කිරීමෙන් ලද ආදායම රු.50,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදි අදාළ නිවැරදි කිරිම් සිදුකිරිමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල දේපල ණය පොලී ආදායම රු.114,035 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී මඟහැරීම් ඇති නොවන ලෙසට කටයුතු සිදු කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **චක්‍රලේඛ** | | | |
| 2021 නොවැම්බර් 12 දිනැති අංක 1/3/2/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියේ 9 වන වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබුණු රු.587,000 ක කැබ් රථ අළුත්වැඩියාවක් අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි . | අනුමැතියන් කඩිනමින් ලබා ගැනිමට කටයුතු කරන බව. | කාර්ය ඉටුකිරිමට පෙර විධිමත්ව අනුමැතිය ලබා ගැනිමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.58,617,757 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 58,303,615 ක් විය .

### 2.2 ආදායම් පරිපාලනය

**ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,349,000 | 1,248,754 | 1,167,685 | 565,808 | 1,349,000 | 1,167,566 | 1222,488, | 484,739 |
| (ii) | කඩ කුලී | 1,200,000 | 502,564 | 500,919 | 23,500 | 250,000 | 334,775 | 321,120 | 21,855 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,275,000 | 2,027,277 | 2,024,277 | 5,000 | 1,200,000 | 980,996 | 978,966 | 2,000 |
| (iv) | වෙනත් ආදායම් ජල | 8,500,000 | 9,914,652 | 10,427,062 | 3,402,476 | 4,000,000 | 7,805,037 | 8,291,645 | 3,914,886 |
| | එකතුව | 14,324,000 | 13,693,247 | 14,119,943 | 3,996,784 | 6,799,000 | 10,288,374 | 10,814,219 | 4,423,480 |

### 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂයන් තුල පැන වූ අධිභාර වලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.537,018 ක මුදලක් තවදුරටත් අයකර ගැනීමට තිබුණි . | අධිභාර නිවේදන වල ඇතුළත් හිග අධිභාර මුදල අය කර ගැනීමට කටයුතු සිදු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව අධිභාර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.38,062,872 ක් පැවැති අතර, ඉන් වසර 1 ට වැඩි හා වසර 5 ට අඩු ශේෂය රු.3,382,195 ක් හා වසර 5 ට වැඩි ශේෂය රු.1,276,232 ක් අයකර නොතිබුණි. | දිර්ඝ කාලීන හිඟ ශේෂ විධිමත් අනුමැතියන් යටතේ කපා හැරිම සඳහා කඩිනමින් කටයුතු කරන බව හා තවදුරටත් හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංවර්ධන ව්‍යාපෘති ණයහිමි ශේෂය රු.15,917,739 ක් පැවැති අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර ශේෂය රු.2,395,599 ක් ද වසර 5ට වැඩි ශේෂය රු.157,543 ක් නිරවුල් කර නොතිබුණි. | කඩිනමින් ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ව්‍යාපාර ක්ෂේත්‍ර 43 කට අදාල ව්‍යාපාර ආයතන 151 ක් ව්‍යාපාර බදු ලේඛනයේ පැවැතියද සමීක්ෂණ වාර්තාවට අනුව ව්‍යාපාර බදු ගෙවන ව්‍යාපාර ආයතන 23 ක් පමණක් හඳුනාගෙන තිබීම හේතුවෙන් සභා බලප්‍රදේශයේ පවතින සියළුම ව්‍යාපාර ආයතන ආවරණය වන පරිදි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි . | ඉදිරියේ දී සියලුම ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණය කර එම තොරතුරු සමීක්ෂණ වාර්තාවට ඇතුළත් කර සටහන් කිරීමට කටයුතු සිදු කරන බව. | සමීක්ෂණ කටයුතු විධිමත්ව සිදුකර වාර්තා කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 සිදුකරන ලද තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා කුලී අය නොකිරීම හේතුවෙන් රු.1,555,949 ක ආදායමක් අහිමි වී තිබුණි . | නව තක්සේරුව 2023.01.20 දින ලැබුණු අතර, 2024 ජනවාරි 01 සිට නව තක්සේරුව ක්‍රියාත්මක කළ බව . | නියමිත කාලය තුල හිමි ආදයම් රැස්කර ගැනීමට කටයුතු කළයුතුයි. |
| (ඉ) | සභාව සතු වාහන 7 ක ඉන්ධන දහන පරිකෂාව සඳහා යොදවා ගත් මාර්ගයේ පවතින දුෂ්කරතා හේතුවෙන්, පරීක්ෂණ ප්‍රතිඵල ප්‍රතික්ෂේප වීම හේතුවෙන් ඒ සඳහා වැය කල රු.45,703 ක ඉන්ධන වියදම නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය . | නැවත ඉන්ධන දහන පරික්ෂාවක් සිදු කිරීමෙන් සභාවට රාජකාරි වශයෙන් හා රාජකාරි වල විනිවිද බාවය පවත්වාගෙන යාමට හැකියාව උදාවූ බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පාසැල් උපකරණ මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම සඳහා භාෂා 03 කින් ජාතික පුවත්පත් 03 ක දැන්වීම් පලකර තිබූ අතර, එම දැන්වීම් මඟින් මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදී නොතිබීමත්, එක් එක් අයිතමයන්ගෙන් මිලදී ගන්නා ප්‍රමාණය සඳහන් නොකිරීමෙන් ලබාගත හැකි වට්ටම් ප්‍රමාණය නිසි පරිදි නොලැබීමත් මත 2023 ජනවාරි 26 දින නැවත මිල කැඳවීම සිදුකර තිබීම හේතුවෙන් රු.54,855 ක නිශ්කාර්යය වියදමක් දැරීමට සිදුවී ඇති බව නිරීක්ෂණය විය. | මුල් පුවත්පත් දැන්වීම පල කිරිමේ දි ප්‍රමාණවත් කාලයක් ලබාදී නොතිබීම හේතුවෙන් වඩාත් තරඟකාරී මිළ ගණන් ලබාගැනිම සඳහා නැවත මිල කැඳවීම් සිදුකළ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 06 ක පුරප්පාඩු 15 ක් පැවතුණු අතර අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරු 04 ක් සඳහා සේවකයින් යොදවා තිබූ අතර එම තනතුරු අනුමත කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි . | සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනිමට ඉල්ලීම් කර ඇත. | කාර්යක්ෂම සේවාවක් සඳහා කඩිනමින් පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ස්ථාන මාරුවී ගිය, සේවය අතහැර ගිය හා මියගිය නිලධාරීන් 10 දෙනෙකුගේ වසර 1 ත් 10 ත් අතර කාලයක සිට හිඟ ණය එකතුව රු.1,759,801 ක ණය ශේෂයන් අයකර නොතිබුණු අතර, ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 7 දෙනෙකුගේ රු.1,390,229 ක ණය ශේෂයන් නිරවුල් කර නොතිබුණි. | කඩිනමින් සේවක ණය ශේෂ නිරවුල් කර ගිණුම් නිරවුල් කිරිමට කටයුතු කරන බව. | ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

**පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ ගිලන් රථ දෙකක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි . | අයිතිය පවරා ගැනිමේ කටයුතු කඩිනමින් සම්පූර්ණ කර ගැනිමට පියවර ගන්නා බව. | අයිතිය පවරා ගැනිමට කටයුතු කල යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ආදායම් විෂයයන් 38 කට අදාල රු.130,935,000 ක ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 50 සිට 100 දක්වා ප්‍රතිශතයක් අයකරගෙන නොතිබූ අතර වැය විෂයයන් 70 කට අදාලව සළසා තිබුණු එකතුව රු.116,408,940 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් සියයට 50 සිට 99 ක් දක්වා ප්‍රතිශතයකින් ඉතිරි කර තිබුණි. වැය විෂයයන් 26 ක එකතුව 18,163,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය වැය කිරීමකින් තොරව ඉතිරි කර තිබීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | නොවැලැක්විය හැකි හේතු මත අය වැය අවසන් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී ඇති බව. | ආදායම් නිවැරදිව පුරෝකථනය කිරීමටත්, අවශ්‍යතාවය හඳුනාගෙන සැළකිල්ලකින් යුතුව වියදම් පුරෝකථනය කර අයවැය පිළියෙල කළ යුතුය. |